# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1984 අංක 13 දරන
# විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1984 අප්‍රේල් මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1984 අප්‍රේල් මස 11 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : රු. 1.20 යි    තැපැල් ගාස්තුව : ශත 60 යි

**1984 අංක 13 දරන විෂවර්ග, අබිං සහ අන්තරායදයක ඖෂධ වර්ග (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1984 අප්‍රේල් මස 11 වන දින]

එල්. ඩී.—ඕ. 26/82.

**විෂවර්ග, අබිං සහ අන්තරායදයක ඖෂධ වර්ග ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.*

**1.** මේ පනත 1984 අංක 13 දරන විෂවර්ග, අබිං සහ අන්තරායදයක ඖෂධ වර්ග (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර එය ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක ක්‍රියාත්මක විය යුතු ය.

*218 වන අධිකාරයේ 28 වන සහ 29 වන වගන්ති ප්‍රතියෝජනය කිරීම.*

**2.** (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් හඳුන්වනු ලබන) විෂවර්ග, අබිං සහ අන්තරායදයක ඖෂධ වර්ග ආඥාපනතේ 28 වන සහ 29 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්ති ආදේශ කරනු ලැබේ :—

*''පොපි ආදිය ආනයනය කිරීම හා අපනයනය කිරීම තහනම් කිරීම.*

28. කිසිම පොපි පැලැටියක්, කෝකා පැලැටියක් හෝ කංසා පැලැටියක් හෝ එවැනි යම් පැලැටියක ඇට, කරල්, කොළ, මල් හෝ යම් කොටසක් හෝ ඒවායේ යම් සැකසුමක් ශ්‍රී ලංකාවට ආනයනය කිරීම හෝ ගෙන ඒම හෝ ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීම නොකළ යුතු ය.

*කංසා පැලැටියෙන්, පොපි පැලැටියෙන් හෝ කෝකා පැලැටියෙන් පිළියෙල කර ගත් දේ ආදිය සන්තකයේ තබා ගැනීම, ප්‍රයෝජනයට ගැනීම ආදිය තහනම් කිරීම.*

29. මෙහි මින්මතු IV වන සහ V වන පරිච්ඡේදවල විධිවිධාන සලසා ඇති පරිදි හැර, කිසිම තැනැත්තකු පහත සඳහන් යම් දෙයක් එකතු කිරීම, පිළියෙල කිරීම, සකස් කිරීම, විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම, නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම, ලබාගැනීම හෝ තමා සන්තකයේ තබා ගැනීම, පරිභෝග කිරීම, බෙදහැරීම හෝ ප්‍රයෝජනයට ගැනීම නොකළ යුතු ය :—

(අ) කංසා පැලැටියෙන් ලබාගත් යම් මැලියම් හෝ සාමාන්‍යයෙන් භාං, හෂිෂ් හෝ ගංජා යනුවෙන් හඳුන්වනු ලබන එම කංසා පැලැටියේ සැකසුම් හෝ සාරයන් හෝ කොටසක් ඒ මැලියම්වලින් සංයුක්ත වන වෙනත් යම් සැකසුමක් ;

(ආ) පොපි පැලැටියෙන් ලබාගත් යම් බිහි ස්‍යන්ධයක් හෝ සාමාන්‍යයෙන් අබිං, මෝෆීන්, හෙරොයින් යනුවෙන් හඳුන්වනු ලබන එම පොපි පැලැටියේ යම් සැකසුමක් හෝ සාරයක් හෝ කොටසක් ඒ මැලියම් වලින් සංයුක්ත වන වෙනත් යම් සැකසුම් ; සහ

(ඇ) කෝකා පැලැටියෙන් යම් සැකසුම්, ක්ෂාරාභ සහ ලවන.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"අබිං පරිභෝග කිරීම ආදිය සඳහා ස්ථාන භාවිතා කිරීම තහනම් කිරීම.

37. කිසිම තැනැත්තකු විසින් තමා සන්තකයේ ඇති යම් ස්ථානයක් අබිං හෝ එහි යම් සැකසුමක්, කෑම, දුම් වශයෙන් ඉරීම, ගබඩා කිරීම, පරිභෝග කිරීම හෝ කෙනකුට දීම සඳහා වූ ස්ථානයක් ලෙස භාවිත කිරීමට දැනුවත්ව ඉඩදීම හෝ අවසර දීම නොකළ යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන සහ 50 වන වගන්ති ඉවත් කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන සහ 50 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලැබේ.

අලුත් 54අ සහ 54ආ වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 54අ වගන්තිය හා 54ආ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතුය :—

'අන්තරායදයක ඖෂධ වර්ග නිෂ්පාදනය කිරීම, ජාවාරම් කිරීම, ආනයනය කිරීම හෝ අපනයනය කිරීම හා සන්තකයේ තබා ගැනීම තහනම් කිරීම.

54අ. (අ) මතු කියැවෙන යම් අන්තරායදයක ඖෂධ වලින් යමක් එනම් :—හෙරොයින් හෝ කොකේන් හෝ මෝෆින් හෝ අබිං, නිෂ්පාදනය කරන යම් තැනැත්තකු මේ ආඥාපනතට විරුද්ධ වූ වරදකට වරදකරු වන අතර ජූරි සභාවක් රහිත මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට මරණීය දණ්ඩන නියමයට හෝ ජීවිතාන්තය දක්වා බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයට යටත් විය යුතු ය ;

(ආ) තුන්වන උපලේඛනයේ III වන කොටසේ II වන තීරයේ දක්වා ඇති යම් අන්තරාය දයක ඖෂධයක්, මේ පරිච්ඡේදයේ විධිවිධාන වලින් අවසර දී ඇති පරිදි හැර හෝ එකී විධිවිධානවලට අනුකූල නොවන ආකාරය කින් නැතහොත් අධ්‍යක්ෂවරයාගේ බලපත්‍රයකින් අවසර දී ඇති පරිදි හැර හෝ ඊට අනුකූල නොවන ආකාරයකින්, එකී II වන තීරයේ දක්වා ඇති ප්‍රමාණය ඉක්මවා ජාවාරම් කරන යම් තැනැත්තකු මේ ආඥා පනතට විරුද්ධව වූ වරදකට වරදකරු වන අතර ජූරි සභාවක් රහිත මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, එම කොටසේ III වන තීරයේ අනුරූප සටහනේ දක්වා ඇති දණ්ඩනයට යටත් විය යුතුය ;

(ඇ) තුන්වන උපලේඛනයේ III වන කොටසේ II වන තීරයේ දක්වා ඇති යම් අන්තරාය දයක ඖෂධයක්, මේ පරිච්ඡේදයේ විධිවිධාන වලින් අවසර දී ඇති පරිදි හැර හෝ එකී විධිවිධානවලට අනුකූල නොවන ආකාරය කින් නැතහොත් අධ්‍යක්ෂවරයාගේ

බලපත්‍රයකින් අවසර දී ඇති පරිදි හැර හෝ ඊට අනුකූල නොවන ආකාරයකින්, එකී II වන තීරයේ දක්වා ඇති ප්‍රමාණය ඉක්මවා ආනයනය හෝ අපනයනය කරන යම් තැනැත්තකු මේ ආඥාපනතට විරුද්ධව වූ වරදකට වරදකරු වන අතර ජූරි සභාවක් රහිත මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, එම කොටසේ III වන තීරයේ අනුරූප සටහනේ දක්වා ඇති දණ්ඩනයට යටත් විය යුතු ය ;

(ඇ) තුන්වන උපලේඛනයේ III වන කොටසේ IIවන තීරයේ දක්වා ඇති යම් අන්තරායදයක ඖෂධයක්, මේ පරිච්ඡේදයේ විධිවිධාන වලින් අවසර දී ඇති පරිදි හැර හෝ එකී විධිවිධාන වලට අනුකූල නොවන ආකාරය කින් නැතහොත් අධ්‍යක්ෂවරයාගේ බලපත්‍රයකින් අවසරදී ඇති පරිදි හැර හෝ ඊට අනුකූල නොවන ආකාරයකින්, එකී IIවන තීරයේ දක්වා ඇති ප්‍රමාණය ඉක්මවා සන්තකයේ තබාගන්නා යම් තැනැත්තකු මේ ආඥාපනතට විරුද්ධවවූ වරදකට වරද කරු වන අතර ජූරි සභාවක් රහිත මහාධි කරණය විසින් වරදකරු කරනු ලැබූ විට, එම කොටසේ III වන තීරයේ අනුරූප සටහනේ දක්වා ඇති දණ්ඩනයට යටත් විය යුතු ය.

මේ වගන්තියෙහි—

"නිෂ්පාදනය කිරීම" යන්න, අන්තරායදයක ඖෂධයක් සම්බන්ධයෙන් යෙදුනු විට, ඒ ඖෂධය නිෂ්පාදනය කිරීමේ යම් ක්‍රියාවලියක් සහ එක් ඖෂධයක් තවත් ඖෂධයක් ලැබෙන පරිදි පිරිසිදු කිරීම හෝ පරිවර්තනය කිරීම ඊට ඇතුළත් වේ ;

"ජාවාරම් කිරීම" යන්නෙන්—

(අ) විකිණීම, දීම, සපයා ගැනීම, ගබඩා කිරීම, යම් තැනැත්තකුට දීම, ප්‍රවාහනය කිරීම, යැවීම, භාරදීම හෝ බෙදා හැරීම ; හෝ

(ආ) (අ) ඡේදයේ සඳහන් යම් දෙයක් කිරීමට ඉදිරිපත් වීම

අදහස් වේ.

54අ වගන්තිය යටතේ වූ වරදක් සිදු කිරීමට අනුබල දීම.

54ආ. 54අ වගන්තිය යටතේ වූ යම් වරදක් සිදුකිරීමට අනුබල දෙන හෝ එම වරද සිදු කිරීමට තැත් කරන හෝ එම වරද සිදු කිරීමට සූදානම් වීමෙහිලා යම් ක්‍රියාවක් කරන හෝ එම වරද සිදු කිරීමෙහිලා යම් ක්‍රියාවක් කරන යම් තැනැත්තකු එම වරදට වරදකරු වන අතර වරදකරු කරනු ලැබූ විට එම වරද සඳහා විධිවිධාන මගින් නියම වී ඇති දඬුවමට යටත් විය යුතු ය.'.

ප්‍රධාන ප්‍රඥප්තියේ 69 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 69 වන වගන්තියේ (ආ) ඡේදයෙහි '' සහ යම් කොටසක්'' යන වචන වෙනුවට '' සහ එහි යම් සැකසුමක් හෝ කොටසක්'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වන වගන්තියේ (5) වන උපවගන්තියෙහි ''රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට'' යන වචන වෙනුවට ''රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අලුත් 77අ සහ 77ආ වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒවා එම ප්‍රඥප්තියේ 77අ සහ 77ආ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය :—

''විශ්ලේෂණය.

77අ. (1) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 116 වන වගන්තියේ පට හැනිව කුමක් සඳහන් වුවද, මේ ආඥාපනතේ III වන පරිච්ඡේදය හෝ V වන පරිච්ඡේදය යටතේ සිදුකරන ලද වරදක් සම්බන්ධයෙන් පොලිස් නිලධරයකු විසින්, තහනමට ගන්නා ලද යම් ඖෂධයක්, ද්‍රව්‍යයක්, භාණ්ඩයක් හෝ සැකසුමක් නැතහොත් එහි යම් කොටසක් හෝ ඔහු විසින් ගන්නා ලද යම් සාම්පලයක් පරීක්ෂණය සඳහා ආණ්ඩුවේ රසපරීක්ෂක වරයා වෙත ඉදිරිපත් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා වෙත ඉදිරිපත් කරන ලද යම් ඖෂධයක්, ද්‍රව්‍යයක්, භාණ්ඩයක් හෝ සැකසුමක් ඔහු විසින් පරීක්ෂා කරනු ලැබූ විට, ඔහු විසින් ඔහුගේ පරීක්ෂණයේ ප්‍රතිඵලය දැක්වෙන වාර්තාවක් ඔහු වෙත ඒ ඖෂධය, ද්‍රව්‍යය, භාණ්ඩය, සැකසුම හෝ එහි යම් කොටසක් හෝ සාම්පලයක් ඉදිරිපත් කළ පොලිස් නිලධරයාට යැවිය යුතු අතර එහි පිටපතක් පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයට ඉදිරිපත් කළ යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ පොලිස් නිල ධරයා වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවක්, මේ ආඥාපනත යටතේ වූ යම් විභාගයකදී, නඩු විභාගයක දී හෝ වෙනත් නඩු කටයුත්තකදී සාක්ෂි වශයෙන් භාරගනු ලැබිය යුතු ය.

(4) පරීක්ෂා කිරීම සඳහා (1) වන උපවගන්තිය යටතේ යම් ඖෂධයක්, ද්‍රව්‍යයක්, භාණ්ඩයක්, සැක සුමක් හෝ එහි යම් කොටසක් හෝ සාම්පලයක් ඉදිරිපත් කරනු ලැබූ ආණ්ඩුවේ රසපරීක්ෂකවරයා විසින්, ඒ පිළිබඳව (2) වන උපවගන්තිය යටතේ වූ ඔහුගේ වාර්තාව ඉදිරිපත් කිරීමෙන් පසුව, එම ඖෂධය, ද්‍රව්‍යය, භාණ්ඩය, සැකසුම හෝ එහි කොටස හෝ සාම්පලය පොලිස් මත්ද්‍රව්‍ය කාර් යාංශයට යැවිය යුතු අතර පොලිස් මත්ද්‍රව්‍ය කාර් යාංශය විසින්, එම ඖෂධය, ද්‍රව්‍යය, භාණ්ඩය, සැකසුම

හෝ එහි කොටස හෝ සාම්පලය විනාශ කිරීම සඳහා මහේස්ත්‍රාත්වරයා විසින් නිකුත් කරන ලද ආඥාවක් අනුව එය වහාම විනාශ කිරීමට සැලැස්විය යුතු ය.

තොරතුරු සපයන්නකුගේ අනන්‍යතාව ආරක්ෂා කිරීම.

77ආ. මේ ආඥාපනතේ III වන පරිච්ඡේදය හෝ V වන පරිච්ඡේදය යටතේ වූ වරදක් පිළිබඳව යම අධිකරණයක් ඉදිරියේ වූ යම නඩු කටයුත්තකදී, අධිකරණය විසින් පටහැනි ආඥාවක් කිරීම යුක්තියේ පරමාර්ථ සඳහා අවශ්‍ය බව අධිකරණයේ මතය වී එසේ පටහැනි ආඥාවක් කළහොත් මිස, ඒ වරද සිදු කිරීම සම්බන්ධ යෙන් තොරතුරු සැපයූ තැනැත්තාගේ නම සහ අනන්‍යතාවය හෙළි කිරීමට හෝ උත්තරයෙන් තොරතුරු සපයන්නාගේ අනන්‍යතාවය සොයා ගත හැකි හෝ සොයාගත හැකිවීමට තුඩුදෙන යම් ප්‍රශ්නයකට උත්තර දීමට කිසිම සාක්ෂිකරුවෙක් බැඳී නොසිටින්නේ ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'' (5) 54අ වගන්තිය යටතේ වූ වරදකට වරදකරු වූ තැනැත්තකු හැර, මේ ආඥාපනතට විරුද්ධ වූ වරදකට වරදකරු වූ සෑම තැනැත්තකු ම එක් එක් වරද සඳහා—

(අ) මහේස්ත්‍රාත්වරයකු විසින් ලඝු ක්‍රමයට වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසකට නොඅඩු සහ රුපියල් දසදහසකට නොවැඩි දඩයකට හෝ පස් අවුරුද්දකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය ;

(ආ) මහාධිකරණය ඉදිරියේ වරදකරු කරනු ලැබූ විට, රුපියල් දසදහසකට නොඅඩු සහ රුපියල් විසිපන්දහසකට නොවැඩි දඩයකට හෝ හය මාසයකට නොඅඩු සහ අවුරුදු හතකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.''.

අලුත් 78අ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ ඇතුළත් කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 78අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

''ඇතැම් දඩ මුදල් පොලිස් ත්‍යාග අරමුදලට ගෙවීම.

78අ. මේ ආඥාපනතේ III වන පරිච්ඡේදය හෝ V වන පරිච්ඡේදය යටතේ සිදු කරන ලද යම් වරදක් සඳහා අය කරන ලද සෑම සහ එක් එක් දඩයකින්ම තුනෙන් එක් පංගුවක් පොලිස් ආඥාපනතේ 73 වන වගන්තිය යටතේ පිහිටුවන ලද පොලිස් ත්‍යාග අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.''

ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය මෙයින් ඉවත්කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

'රාජ්‍ය සන්තක කිරීම.

79. (1) මේ ආඥාපනතට හෝ ඒ යටතේ සාදනලද නියෝගයකට විරුද්ධව වූ වරදකට යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ අවස්ථාවක, ඒ වරද කරනු ලැබූ වේ යම් භාණ්ඩ සම්බන්ධයෙන්ද ඒ භාණ්ඩ සියල්ලම හෝ ඉන් යමක් සහ එම භාණ්ඩය ගෙන යාම සඳහා භාවිත කරනු ලැබූ යම් ඔරුවක්, යාත්‍රාවක්, වාහනයක්, ගුවන් යානයක් හෝ ගුවනින් ගමන් කරන වාහන යක් හෝ උපකරණයක්, ඒ වරදකරු කරනු ලැබීමේ හේතුවෙන් රාජ්‍ය සන්තක වන්නේ යයි, අධිකරණය විසින් ආඥා කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ රාජ්‍ය සන්තක කරන ලද යම් දේපළක්—

(අ) අදාළ වරදකරු කරනු ලැබීමට විරුද්ධව අභියාචනාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කර නැත්නම්, එකී වරදකරු කරනු ලැබීමට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කිරීම සඳහා වූ නියමිත කාල සීමාව ඉකුත් වන දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍යය වෙත සම්පූර්ණයෙන් සතු විය යුතු ය ;

(ආ) අදාළ වරදකරු කරනු ලැබීමට විරුද්ධව අභියාචනාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කර ඇත්නම්, අභියාචනයේදී ඒ වරදකරු කරනු ලැබීම ස්ථිර කරනු ලැබූ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍යය වෙත සම්පූර්ණයෙන් සතු විය යුතු ය.

මේ උපවගන්තියෙහි ''අදාළ වරදකරු කරනු ලැබීම'' යන්නෙන්, (1) වන උපවගන්තිය යටතේ යම් දේපලක් රාජ්‍ය සන්තක වීමට හේතුවූ වරදකරු කරනු ලැබීම අදහස් වේ.'.

අලුත් 79අ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ ඇතුළත් කිරීම.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 79අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

'ඇසිටිල්කරණ ද්‍රව්‍ය පාලනය කිරීම.

79අ. (1) ඇසිටිල්කරණ ද්‍රව්‍යයක් තම සන්තක යේ තබා ගෙන සිටින යම් තැනැත්තකු—

(අ) එම ද්‍රව්‍යය සන්තකව සිටීමට මේ ආඥා පනත යටතේ ඔහු බලපත්‍ර ලබා සිටින බව ;

(ආ) එම ද්‍රව්‍යය සන්තකව සිටීමට මෙ ආඥාපනත යටතේ ඔහුට බලය ලැබී ඇති බව ; හෝ

(ඇ) එම ඇසිටිල්කරණ ද්‍රව්‍යය නීත්‍යානුකූල කාර්ය යක් සඳහා ඔහුගේ සන්තකයේ තිබෙන බව

ඔප්පු කළහොත් මිස, මේ ආඥාපනතට විරුද්ධව වූ වරදකට වරදකරු විය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ වූ වරදක් පිළිබඳව වූ යම් නඩු කටයුත්තක දී, යම් ඇසිටිල්කරණ ද්‍රව්‍යයක් තමාගේ භාරයේ හෝ පාලනය යටතේ තබා ගෙන සිට අසුවන යම් තැනැත්තකු, පටහැනි තත්ත්වය ඔප්පු කළ හොත් මිස, එම ද්‍රව්‍යය සන්තකව සිටි ලෙස හා එම ද්‍රව්‍යයේ ස්වභාවය දැන සිටි ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ "ඇසිටිල්කරණ ද්‍රව්‍යය" යන්නෙන්, ඇසිටිල් කාණ්ඩ (CH3.CO–) එකක් හෝ වැඩි ගණනක්, රසායනික ක්‍රියාවලියක් මගින් වෙනත් ද්‍රව්‍යයකට ඇතුළු කළ හැකි ද්‍රව්‍යයක් අදහස් වේ. '.

අලුත් 82 වන සහ 83 වන වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියේ ඇතුළත් කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තියට ඉක්බිතිවම පහත දක්වෙන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර ඒවා එහි 82 වන සහ 83 වන වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය :—

"V වන පරිච්ඡේදය යටතේ සිරභාරයට ගනු ලැබූ තැනැත්තන් සම්බන්ධයෙන් වූ විශේෂ විධිවිධාන.

82. (1) මේ ආඥාපනතේ V වන පරිච්ඡේදයේ යම් විධිවිධානයක් කඩ කිරීම සම්බන්ධයෙන් සැක කරනු ලැබූ හෝ චෝදනා කරනු ලබන තැනැත්තන් සම්බන්ධයෙන්, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 36, 37 සහ 38 වන වගන්ති වල විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(2) මේ ආඥාපනතේ V වන පරිච්ඡේදය යටතේ වූ වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් සැකකරනු ලැබූ හෝ චෝදනා කරනු ලැබූ යම් තැනැත්තකු වරෙන්තු වක් නොමැතිව සිරභාරයට ගන්නා යම් පොලිස් නිලධරයකු විසින්, අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව සහ සිරභාරයට ගැනීමෙන් පැය විසිහතරක් ඇතුළත ඒ නඩුව සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති මහේස් ත්‍රාත්වරයකු ඉදිරියෙහි ඒ තැනැත්තා ඉදිරිපත් කළ යුතු ය.

(3) ඒ තැනැත්තා අත් අඩංගුවේ රඳවා ගැනීම විමර්ශනය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය බවට පොලිස් අධිකාරීවරයකුගේ නිලයට පහළ නොවූ නිලයක් දරන පොලිස් නිලධරයකු විසින් හෝ ඔහු නොමැති විටකදී නම් ඔහු වෙනුවෙන් ක්‍රියා කරන නිලධරයා විසින් සහතිකයක් ඉදිරිපත් කරනු ලැබූ විට, ඒ තැනැත්තා දින හතකට නොවැඩි කාලයක් පොලිස් අත් අඩංගුවේ රඳවා ගැනීමට අවසර දෙන ආඥාවක් මහේස්ත්‍රාත්වරයා විසින් කළ යුතු ය.

(4) විමර්ශනය කිරීම අවසාන වීම හෝ රඳවා තබා ගැනීමේ කාල සීමාව අවසානවීම යන්නෙන් පළමුව සිදුවන්නේ යමක්ද එය සිදුවූ විට ඒ තැනැත්තා මහේස්ත්‍රාත්වරයා ඉදිරියට පත් කරනු ලැබිය යුතු අතර, මේ ආඥාපනතේ 83 වන වගන්තියේ විධි විධානවලට යටත්ව, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන ඒ තැනැත්තාට සහ ඒ තැනැත්තා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

විශේෂ අවස්ථාවලදී හැර, 54 අ හෝ 54 ආ වන වගන්ති යටතේ වූ වරදක් සම්බන්ධයෙන් ඇප නොදිය යුතු බව.

83. (1) මේ ආඥාපනතේ 54අ හෝ 54ආ වන වගන්ති යටතේ වූ වරදක් සම්බන්ධයෙන් සැක කරනුලැබූ හෝ චෝදනා කරනුලැබූ යම් තැනැත්තකු, විශේෂ අවස්ථාවලදී, මහාධිකරණය විසින් මිස, ඇප පිට නිදහස් නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුවද, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 15 දරන අපරාධ නඩු විධාන (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන ඒ නීතිය ක්‍රියාත්මකව පවතින තාක් කල්, මේ ආඥාපනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් සැක කරනු ලැබූ හෝ චෝදනා කරනු ලැබූ තැනැත්තකුට හා තැනැත්තකු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය සංශෝධනය කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම උපලේඛනයේ I වන කොටසේ ''ආ'' වින්‍යාසය වෙනුවට පහත දක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

' '' ආ '' වින්‍යාසය

(48, 51 සහ 68 වන වගන්ති)

ආනයනය කිරීම, අපනයනය කිරීම සහ සිල්ලර සහ තොග වෙළෙඳාම සම්බන්ධ විධිවිධාන අදාළ වන ඖෂධ, ද්‍රව්‍ය, භාණ්ඩ හෝ සැකසුම්

අබිං

කංසා පැලෑටියේ යම් සාරයක් හෝ ටින්චරයක්.

මෝෆින් සහ එහි ලවන.

(කෘත්‍රිම කොකේන් ඇතුළුව) කොකේන් එගනයින් සහ ඒවායේ ඒ ඒ ලවන. මෝෆින් හෝ කොකේන් කවර හෝ අනුපාතයකින් ඇත්තා වූද ද්‍රව හෝ ඝන යම් අක්‍රිය ද්‍රව්‍යයක ඇත්තා වූද යම් මෝෆින් හෝ කොකේන් හෝ ඒවායේ ලවනවල යම් ද්‍රාවණයක් හෝ තනුකනයක් සහ මෝෆින් සියයට 1/5 කට නොඅඩු හෝ කොකේන් හෝ එගනයින් සියයට 1/10 කට නොඅඩු ප්‍රමාණයක් අඩංගු වන්නා වූද (ඉහත කී ආකාරයේ ද්‍රාවණයක් හෝ තනුකනයක් නොවන්නාවූ ද) යම් සැකසුමක්, සම්මිශ්‍රණයක්, සාරයක් හෝ වෙනත් ද්‍රව්‍යයක්.

ඇසිටෝෆිපයින්
ඇසිටිල් මෙතඩෝල්
ඇලිල් ප්‍රෝඩයින්
ඇල්ෆායිටිල් මෙතඩෝල්
ඇල්ෆාමෙප්‍රෝඩයින්
ඇල්ෆාමෙතඩෝල්

ඇල්ෆාප්‍රෝඩයින්
ඇම්ෆිටමයින්
ඇනිලෙරිඩයින්
බෙන්සෙතිඩයින්
බීටාසිටල් මෙතඩෝල්
බීටාමෙප්‍රෝඩයින්
බීටාමෙතඩෝල්
බීටාප්‍රෝඩයින්
බෙසිට්‍රාමයිඩ
කැනබිස් සහ කැනබිස් මැලියම
ක්ලෝනිටාසෙනෝ
කොකේන් (බෙන්සොයිල් එගමයින්වල මිතයිල් එස්ටර්)
කෝඩීන් (මිතයිල් මෝෆින්)
කොඩොක්සයින්
ඩෙසොමෝෆයින්
ඩී.ඊ.ටී.
ඩෙක්සැම්ෆිටමයින්
ඩෙක්ට්‍රෝමොරාමයිඩ
ඩයිඇම්ප්‍රෝමයිඩ
ඩයිතිල් හියාම්බුටෙන්
ඩයිෆෙක්සෝක්සින්
ඩයිමෙනොක්සාඩොල්
ඩයිමෙතිල් තියැම්බුටින්
ඩයොක්සාෆිටයිල් බුටයිරේට
ඩයිෆෙනොක්සිලේට
ඩයිපිපනෝන්
*ඩී. එම්. එච්. පී.
*ඩී. එච්. ටී.
ඩරොටිබැනොල්
එගනයින්, එහි එස්ටින් සහ එගනයින් සහ කොකේන් බවට පරිවර්තනය කළ හැකි එහි ව්‍යුත්පන්න
ඊතයිල් මිතයිල් තියැම්බුටෙන්
එටෝනිටසීන්
එටෝෆයින්
ඉටොක්සෙරිඩින්
ෆෙන්ටානිල්
ෆියුරිතිඩයින්
හොරොයින් (ඩයාසිටිල් මෝෆින්)
හයිඩරෝකෝඩෝන්
හයිඩරෝමෝෆිනෝල්
හයිඩරෝමෝෆෝන්
හයිඩරොක්සි පෙතිඩයින්
අයිසොමෙතඩෝන්
කෙටෝබෙම්ඩෝන්
ලිවෝමෙකෝෆන්

ලිරෝමොරමයිඩ

ලිරෝෆෙනසයිල් මෝෆින්

ලිරෝවර්ෆනෝල්

*(+) — ලයිසර්ජයිඩ +

*මෙස්කලයින්

මෙටසොසයින්

මෙථඩෝන්

*මෙතඩෝන්-ඉන්ටමීඩියේට් (4–සයානෝ–2 ඩයිමෙතිල් ඇමිනෝ–4, 4–ඩයිෆෙනිල් බියුටේන්)

*මෙතුමීෆිටමයින්

මීතයිල් ඩෙසෝපින්

මීතයිල් ඩයිහයිඩරෝමෝෆින්

*මීතයිල් ෆෙනිඩේට්

ටෙට්‍රා හයිඩරෝකැනබිනෝ;'.

(2) එම උපලේඛනයේ II කොටස අගට පහත දැක්වෙන අලුත් කොටස එකතු කිරීමෙන් :—

" III වන කොටස

| I වන තීරය<br>වරදේ ස්වභාවය | II වන තීරය<br>ප්‍රමාණ | III වන තීරය<br>දණ්ඩනය |
|---|---|---|
| ජාවාරම් කිරීම, සන්තකයේ තබා ගැනීම, ආනයනය කිරීම හෝ අපනයනය කිරීම. | අබිං ග්‍රෑම් 500ක් සහ ඊට වැඩි ... | මරණ දණ්ඩනය හෝ ජීවිතාන්තය දක්වා බන්ධනාගාර ගත කිරීම. |
| එම ... | මෝෆින් ග්‍රෑම් 3ක් සහ ඊට වැඩි ... | එම. |
| එම .. | කොකේන් ග්‍රෑම් 2ක් සහ ඊට වැඩි ... | එම. |
| එම ... | හෙරොයින් ග්‍රෑම් 2ක් සහ ඊට වැඩි ... | එම. |
| එම ... | අබිං ග්‍රෑම් 50 සිට 500 දක්වා ... | රුපියල් දෙදහස් පන්සියයකට නොඅඩු සහ රුපියල් විසිපන්දහසකට නොවැඩි දඩයක් හෝ එක් අවුරුද්දකට නොඅඩු සහ අවුරුදු දහයකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකම. |
| එම ... | මෝෆින් ග්‍රෑම් 1කට නොවැඩි ... | රුපියල් දස දහසකට නොඅඩු සහ රුපියල් විසිපන්දහසකට නොවැඩි දඩයක් හෝ අවුරුදු දෙකකට නොඅඩු සහ අවුරුදු පහකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකම. |
| එම .. | මෝෆින් ග්‍රෑම් 1 සිට 3 දක්වා ... | රුපියල් විසිපන්දහසකට නොඅඩු සහ රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු පහකට නොඅඩු සහ අවුරුදු දහයකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකම. |
| එම ... | හෙරොයින් ග්‍රෑම් 1කට නොවැඩි ... | රුපියල් පහළොස් දහසකට නොඅඩු සහ රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට සහ අවුරුදු තුනකට නොඅඩු සහ අවුරුදු හතකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම. |
| එම ... | හෙරොයින් ග්‍රෑම් 1 සිට 2 දක්වා ... | රුපියල් එක් ලක්ෂයකට නොඅඩු සහ රුපියල් පන් ලක්ෂයකට නොවැඩි දඩයකට සහ අවුරුදු හතකට නොඅඩු සහ අවුරුදු විස්සකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම. |
| එම ... | කොකේන් ග්‍රෑම් 1කට නොවැඩි ... | රුපියල් දසදහසකට නොඅඩු සහ රුපියල් විසිපන් දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොඅඩු සහ අවුරුදු පහකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකම. |

| I වන තීරය<br>වරදේ ස්වභාවය | II වන තීරය<br>ප්‍රමාණ | III වන තීරය<br>දණ්ඩනය |
| --- | --- | --- |
| ජාවාරම් කිරීම, සන්තකයේ තබා ගැනීම, ආනයනය කිරීම හෝ අපනයනය කිරීම. | කොකේන් ග්‍රෑම් 1 සිට 2 දක්වා ... | රුපියල් විසිපන්දහසකට නොඅඩු සහ රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු පහකට නොඅඩු සහ අවුරුදු දහයකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකම. |
| එම ... | කැනබිස් කිලෝග්‍රෑම් 5ක් හා ඊට වැඩි ... | රුපියල් විසිපන්දහසකට නොඅඩු සහ රුපියල් පනස්දහසකට නොවැඩි දඩයක් හෝ අවුරුදු දෙකකට නොඅඩු සහ අවුරුදු පහකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම. |
| එම ... | කැනබිස් කිලෝග්‍රෑම් 5කට නොවැඩි ... | රුපියල් විසිපන්දහසකට නොවැඩි දඩයක් හෝ එක් අවුරුද්දකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම.''. |